සැ. යු. — 2014.02.13 දින පළ වූ අංක 1,850 දරන ගැසට් පත්‍රයේ I:III සහ IV (අ) කොටස් පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,851 - 2014 පෙබරවාරි මස 21 වැනි සිකුරාදා - 2014.02.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 266 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 268 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 273 |


*සැ. යු.* - (i) රෝයල් චැරිටි පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2014 ජනවාරි මස 31 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි **ගැසට් පත්‍රය පළ වූ දින සිට** තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 මාර්තු මස 14 දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 පෙබරවාරි මස 28 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# පළාත් පාලන නිවේදන

## නුවරඑළිය මහ නගර සභාව

### ගෝඝාතක ආඥාපනත

ගෝ ඝාතක ආඥා පනතේ 272 අධිකාරයේ 17(1) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව නුවරඑළිය මහා නගර සභාවේ නගරාධිපති මහින්ද දොඩම්පෙගමගේ වන මා විසින් 2014 වර්ෂය තුළ මෙහි පහත උපලේඛනයට අනුව එහි සඳහන් දිනයන්හි දී සහ රජය විසින් ප්‍රකාශයට පත් කරනු ලබන දිනයන්, මා විසින් විටින් විට නිකුත් කරනු ලබන නියෝග අනුව වැසිය යුතු දියන්හි දී ද, නුවරඑළිය මහා නගර සභා බල ප්‍රදේශය තුළ සහ නානුඔය ගවඝාතකාගාරය ද ඇතුලත්ව මස් පිණිස සතුන් මැරීම/මස් විකිණීම/මස් විකිණීම පිණිස ප්‍රදර්ශනය කොට තැබීම හා මස් වර්ග විකුණනු ලබන ස්ථාන විවෘත කොට තැබීම සපුරා තහනම් බව මෙයින් නිවේදනය කරමි.

උපලේඛනය

| | | |
|---|---|---|
| 2014 වර්ෂයේ | ජනවාරි 14 වන අඟහරුවාදා | දෙමළ තෛපොංගල් දිනය |
| 2014 වර්ෂයේ | ජනවාරි 15 වන බදාදා | දුරුතු පුර පසලොස්වක පෝය දිනය |
| 2014 වර්ෂයේ | පෙබරවාරි 04 වන අඟහරුවාදා | ජාතික දිනය |
| 2014 වර්ෂයේ | පෙබරවාරි 14 වන සිකුරාදා | නවම් පුර පසලොස්වක පෝය දිනය |
| 2014 වර්ෂයේ | පෙබරවාරි 27 වන බ්‍රහස්පතින්දා | මහා ශිවරාත්‍රි දිනය |
| 2014 වර්ෂයේ | මාර්තු 16 වන ඉරිදා | මැදින් පුර පසලොස්වක පෝය දිනය |
| 2014 වර්ෂයේ | අප්‍රේල් 14 වන සඳුදා | බක් පුර පසලොස්වක පෝය දිනය |
| 2014 වර්ෂයේ | අප්‍රේල් 18 වන සිකුරාදා | මහා සිකුරාදා දිනය |
| 2014 වර්ෂයේ | මැයි 01 වන බ්‍රහස්පතින්දා | මැයි දිනය |
| 2014 වර්ෂයේ | මැයි 14 වන බදාදා | වෙසක් පුර පසලොස්වක පෝය දිනය |
| 2014 වර්ෂයේ | මැයි 15 වන බ්‍රහස්පතින්දා | වෙසක් පුර පසලොස්වක පෝය දිනයට පසු දිනය |
| 2014 වර්ෂයේ | ජුනි 12 වන බ්‍රහස්පතින්දා | පොසොන් පුර පසලොස්වක පෝය දිනය |
| 2014 වර්ෂයේ | ජූලි 12 වන සෙනසුරාදා | ඇසළ පුර පසලොස්වක පෝය දිනය |
| 2014 වර්ෂයේ | අගෝස්තු 10 වන ඉරිදා | නිකිණි පුර පසලොස්වක පෝය දිනය |
| 2014 වර්ෂයේ | සැප්තැම්බර් 08 වන සඳුදා | බිනර පුර පසලොස්වක පෝය දිනය |
| 2014 වර්ෂයේ | ඔක්තෝබර් 04 වන සෙනසුරාදා | ලෝක සත්ව දිනය |
| 2014 වර්ෂයේ | ඔක්තෝබර් 08 වන බදාදා | වප් පුර පසලොස්වක පෝය දිනය |
| 2014 වර්ෂයේ | ඔක්තෝබර් 22 වන බදාදා | දීපවාලි උත්සව දිනය |
| 2014 වර්ෂයේ | නොවැම්බර් 06 වන බ්‍රහස්පතින්දා | ඉල් පුර පසලොස්වක පෝය දිනය |
| 2014 වර්ෂයේ | දෙසැම්බර් 06 වන සෙනසුරාදා | උඳුවප් පුර පසලොස්වක පෝය දිනය |

රජය විසින් ප්‍රකාශයට පත් කරන වෙනත් දිනයන්.

මහින්ද දොඩම්පෙගමගේ,
නගරාධිපති, නුවරඑළිය.

2014 ජනවාරි ම ස 30 වැනි දින,
නුවරඑළිය මහා නගර සභා කාර්යාලයේ දී ය.

02-471

---

## මහනුවර මහ නගර සභාව

### ගෝඝාතක ආඥාපනත

ගෝඝාතක ආඥා පනතේ 272 අධිකාරය අංක 17(1) දරන වගන්තිය අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නියමිත අධිකාරි තැන වූ මහනුවර පුරපති මහින්ද්‍ර රත්වත්තේ වන මම 2014 වර්ෂය තුළ දී මහනුවර මහ නගර සීමාව තුළ දී මෙහි පහත සඳහන් දිනයන්හි දී මස් පිණිස සතුන් මැරීම හා මස් වෙළඳාමත්, ද දෙවැනි උපලේඛනයේ සඳහන් දිනයන්හි දී මස් පිණිස සතුන් මැරීමත්, මස් වෙළඳාමත් සම්පූර්ණයෙන් තහනම් කරමි.

පළමු වන උපලේඛනය

| | |
|---|---|
| 2014 ජනවාරි මස 15 වැනි බදාදා | දුරුතු පුර පසලොස්වක පෝය දිනය |
| 2014 පෙබරවාරි මස 14 වැනි සිකුරාදා | නවම් පුර පසලොස්වක පෝය දිනය |
| 2014 මාර්තු මස 16 වැනි ඉරිදා | මැදින් පුර පසලොස්වක පෝය දිනය |
| 2014 අප්‍රේල් මස 14 වැනි සඳුදා | බක් පුර පසලොස්වක පෝය දිනය |
| 2014 මැයි මස 14 වැනි බදාදා | වෙසක් පුර පසලොස්වක පෝය දිනය |
| 2014 මැයි මස 15 වැනි බ්‍රහස්පතින්දා | වෙසක් පුර පසලොස්වක පෝය දිනයට පසු දිනය |
| 2014 ජුනි මස 12 වැනි බ්‍රහස්පතින්දා | පොසොන් පුර පසලොස්වක පෝය දිනය |

| | |
|---|---|
| 2014 ජුලි මස 12 වැනි සෙනසුරාදා | ඇසළ පුර පසළොස්වක පෝය දිනය |
| 2014 අගෝස්තු මස 10 වැනි ඉරිදා | නිකිණි පුර පසළොස්වක පෝය දිනය |
| 2014 සැප්තැම්බර් මස 08 වැනි සඳුදා | බිනර පුර පසළොස්වක පෝය දිනය |
| 2014 ඔක්තෝබර් මස 08 වැනි බදාදා | වප් පුර පසළොස්වක පෝය දිනය |
| 2014 නොවැම්බර් මස 06 වැනි බ්‍රහස්පතින්දා | ඉල් පුර පසළොස්වක පෝය දිනය |
| 2014 දෙසැම්බර් මස 06 වැනි සෙනසුරාදා | උඳුවප් පුර පසළොස්වක පෝය දිනය |

දෙවන උපලේඛනය

**වර්ෂය තුළ සෑම මසකම ඉරිදා සහ ප්‍රසිද්ධ නිවාඩු දිනයන්**

| | |
|---|---|
| 2014 ජනවාරි මස 14 වැනි අඟහරුවාදා | දෙමළ තෛපොංගල් දිනය |
| 2014 ජනවාරි මස 14 වැනි අඟහරුවාදා | නබිනායකතුමාගේ උපන් දිනය |
| 2014 පෙබරවාරි මස 04 වැනි අඟහරුවාදා | ජාතික දිනය |
| 2014 පෙබරවාරි මස 27 වැනි බ්‍රහස්පතින්දා | මහා සිව රාත්‍රී දිනය |
| 2014 අප්‍රේල් මස 13 වැනි ඉරිදා | සිංහල හා දෙමළ අලුත් අවුරුදු දිනට පෙර දිනය |
| 2014 අප්‍රේල් මස 14 වැනි සඳුදා | සිංහල හා දෙමළ අලුත් අවුරුදු දිනය |
| 2014 අප්‍රේල් මස 18 වැනි සිකුරාදා | මහා සිකුරාදා දිනය |
| 2014 මැයි මස 01 වැනි බ්‍රහස්පතින්දා | මැයි දිනය |
| 2014 ජුලි මස 29 වැනි අඟහරුවාදා | රාමසාන් දිනය |
| 2014 ඔක්තෝබර් මස 04 වැනි සෙනසුරාදා | ලෝක සත්ව දිනය |
| 2014 ඔක්තෝබර් මස 05 වැනි ඉරිදා | ඊදුල් අල්හා (හජ්ජි උත්සව දිනය) |
| 2014 ඔක්තෝබර් මස 22 වැනි බදාදා | දීපවාලී උත්සව දිනය |
| 2014 දෙසැම්බර් මස 25 වැනි බ්‍රහස්පතින්දා | නත්තල් උත්සව දිනය |

මීට අමතරව විශේෂ හේතූන් මත රජය විසින් හා මා විසින් නියෝග කරනු ලබන වෙනත් දිනයන්වලදී.

මහින්ද රත්වත්තේ,
මහනුවර පුරපති.

2014 පෙබරවාරි මස 03 වැනි දින,
මහනුවර මහ නගර සභා කාර්යාලයේ දී ය.

02-645

---

**කොබෙයිගනේ ප්‍රාදේශීය සභාව**

මාර්ග නම් කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 198 වගන්තිය මගින් පැවරී ඇති බලතල ප්‍රකාරව හා ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අනුමැතිය ලැබූ පහත උපලේඛනයේ සඳහන් මාර්ගයන් පහත සඳහන් අයුරින් නම් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

**උපලේඛනය**

| *අනු. අංකය* | *පැවති නාමය* | *සංශෝධිත නාමය* | *සභා තීරණය* |
|---|---|---|---|
| 01 | විතිකුලිය ස.ණ.ස සමිතිය අසලින් දිවෙන තාර පාර | සෙන්පති ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත | මහා සභාවේ යෝජනා අංක 4-iii |
| 02 | විහාරස්ථානය උතුරින් දිවෙන පාර | බෝධිරාජ මාවත | මහා සභාවේ යෝජනා අංක 4-iii |
| 03 | විතිකුලිය නො. 2 පාර | බුද්ධ ජයන්ති මාවත | මහා සභාවේ යෝජනා අංක 4-iii |
| 04 | අබේසේකර මහතාගේ නිවස අසලින් දිවෙන පාර | ශ්‍රී රතන සාර නාහිමි මාවත | මහා සභාවේ යෝජනා අංක 4-iii |

එච්. ඒ. යූ. ඩී. හෙට්ටිආරච්චි,
සභාපති,
කොබෙයිගනේ ප්‍රාදේශීය සභාව.

02-643

**බදුල්ල මහ නගර සභාව**

ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථාව පිළිගෙන වැළඳ ගැනීම

අංක 1778/45 දරන 2012.10.05 දිනැති අතිවිශෙෂ *ගැසට් පත්‍රයේ* iv(අ) කොටසේ ඌව පළාත් සභාව විසින් නිවේදනය කරනු ලැබ, නැවත ඌව පළාත් සභාව විසින් 2013.04.04 වැනිදා දින පවත්වන ලද සභා රැස්වීමේදී සම්මත කළ, අංක 1824 දරන 2013.08.16 වැනි දිනැති *ගැසට් පත්‍රයේ* පළ කරන ලද පළාත් පාලන ආයතනවලට අදාළ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථාව බදුල්ල මහ නගර සභාව විසින් පිළිගෙන වැළඳ ගත යුතුය යන්න මුදල් සංස්ථාපිත හා නීති පිළිබඳ ස්ථාවර කාරක සභාව විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව 2013 වර්ෂයේ ජූලි මාසයේ පැවති මාසික සභා රැස්වීමේදී තීරණ අංක 16 යටතේ සභා සම්මත වූ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

උපාලි නිශ්ශංක ගුණසේකර,
නගරාධිපති.

2014 ජනවාරි මස 23 වැනි දින,
බදුල්ල මහා නගර සභා කාර්යාලයේ දී ය.

02-495

---

**බිංගිරිය ප්‍රාදේශීය සභාව**

විනෝද බද්ද පැනවීම

(276 වැනි අධිකාරිය වූ) විනෝද බදු ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර බිංගිරිය ප්‍රාදේශීය සභාව විසින් සම්මත කරන ලද පහත සඳහන් යෝජනාව, එකී වගන්තියේ (2) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර වයඹ පළාතේ පළාත් පාලන අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද බව එකී උපවගන්තිය අනුව මෙයින් පළ කරනු ලැබේ.

**යෝජනාව**

(276 වැනි අධිකාරය වූ) විනෝද බදු ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර බිංගිරිය ප්‍රාදේශීය සභාව, සභාවේ පරිපාලන සීමා ඇතුළත වූ ප්‍රදේශයෙහි පවත්වනු ලබන, එකී ආඥාපනතේ විස්තර කර ඇති යම් විනෝද කටයුත්තකට ඇතුලුවීම පිණිස කරනු ලබන ගෙවීමකින් (විනෝද බදු හැර) සියයට දහය (10%) කට සමාන බද්දක් පනවා අයකළ යුතු යැයිද, මෙම යෝජනා සම්මතය *ගැසට් පත්‍රයේ* පළකරන මාසයට ඉක්බිතිවම එළඹෙන මාසයේ පළමුවන දින සිට ක්‍රියාත්මක විය යුතු යයි ද යෝජනා කරන්නීය.

දයාසිරි ජයසේකර,
පළාත් පාලන අමාත්‍ය,
වයඹ පළාත.

2014 ජනවාරි මස 20 වැනි දින,
වයඹ පළාත් පාලන අමාත්‍යාංශයේ දීය.

02-644

---

# විවිධ දැන්වීම්

**ඇළහැර ප්‍රාදේශීය සභාව - බකමූණ**

2014 වර්ෂයට කර්මාන්ත බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තිය යටතේ ඇළහැර ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2013 වර්ෂයේ නොවැම්බර් මස 20 වැනි දින පවත්වන ලද ප්‍රාදේශීය සභා මාසික මහ සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

අමරවංශ මොහොට්ටිගේ,
සභාපති,
ඇළහැර ප්‍රාදේශීය සභාව,
බකමූණ.

2013 නොවැම්බර් මස 20 වැනි දින,
ඇළහැර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ 1 වැනි උපවගන්තිය යටතේ ඇළහැර ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර ඇළහැර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුලත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයෙහි I වැනි තීරුවෙහි නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2014 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවත් එකී බදු මුදල 2014 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර ගෙවා අවසන් කළ යුතු බවත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ධම්මිකා චාන්දනී මැතිනිය විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජානක නලින් කුමාර මැතිතුමා ස්ථිර කිරීමෙන් පසු සභා සම්මත විය.

*උපලේඛනය 04*

| | I වැනි තීරය<br>කර්මාන්තයේ ස්වභාවය | II වැනි තීරය<br>පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම | | |
|---|---|---|---|---|
| | | රු. 750<br>ඉක්මවන විට | රු. 750ට වැඩි<br>නමුත් රු. 1,500<br>නොඉක්මවන විට | රු. 1,500<br>ඉක්මවනවිට |
| | | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| 01. | කුළු බඩු තොග අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 02. | කුළු බඩු සිල්ලරට අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 1,000 0 |
| 03. | සිල්ලර වෙළෙඳාම (සංචාරක) පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 1,000 0 |
| 04. | ග්‍රොසරි බඩු, අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 05. | සාප්පු බඩු, මනි බඩු අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 06. | රෙදිපිළි අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 07. | නිමිඇඳුම් අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 08. | ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 1,000 0 |
| 09. | රෙදි පිළි බතික් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | ටෙන්ට් රෙදි නිෂ්පාදනය හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | ඔරලෝසු අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | ඔරලෝසු අළුත් වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 750 0 | 1,000 0 |
| 13. | ගුවන් විදුලි, රූපවාහිනී උපකරණ ඇතුළු ගෘහ විදුලි උපකරණ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | ගුවන් විදුලි, අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | වානේ ගෘහ භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 16. | වානේ ගෘහ භාණ්ඩ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 17. | ගෑස් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 18. | පාපැදි අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 19. | පාපැදි අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 350 0 | 500 0 | 1,000 0 |
| 20. | පාපැදි අමතර කොටස් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 21. | යතුරුපැදි අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 22. | යතුරු පැදි ඇතුළු සියලු වාහන අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 23. | යතුරු පැදි ඇතුළු සියලු වාහන අමතර කොටස් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 24. | යතුරුපැදි, ත්‍රිවිල් රථ ඇතුළු සියලු වාහන සර්විස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 25. | අත්ට්‍රැක්ටර් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 26. | අත් ට්‍රැක්ටර් අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 27. | ට්‍රැක්ටර් රථ සඳහා ට්‍රේලර් සෑදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 28. | ටයර් ටියුබ් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 29. | ටයර් ටියුබ් මාරු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 30. | පෑස්සුම් වැඩ පලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 31. | ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 32. | මුද්‍රණාලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 33. | පරිගණක ඇතුළු අමතර කොටස් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 34. | පරිගණක පුහුණු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 35. | බැටරි ආරෝපණය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 36. | බැටරි අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 37. | යතුරු තහඩු කැපීමේ හා නාම පුවරු කැපීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 38. | ගොවි උපකරණ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

| | *I වැනි තීරය*<br>*කර්මාන්තයේ ස්වභාවය* | *II වැනි තීරය*<br>*පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම* | | |
|---|---|---|---|---|
| | | *රු. 750*<br>*ඉක්මවන විට* | *රු. 750ට වැඩි*<br>*නමුත් රු. 1,500*<br>*නොඉක්මවන විට* | *රු. 1,500*<br>*ඉක්මවවිට* |
| | | *රු. ශ.* | *රු. ශ.* | *රු. ශ.* |
| 39. | ගොවි උපකරණ අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 40. | කෘෂි බීජ වර්ග අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 41. | කෘෂිරසායන ද්‍රව්‍ය අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 42. | පොහොර වර්ග අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 43. | හිස්බූලි, ගෝනි, පරණ යකඩ බෝතල් එකතු කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 44. | දර මඩුවක් හෝ දර අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 45. | පැල තවානක් හෝ අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 46. | උත්සව භාණ්ඩ කුලියට දීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 47. | උත්සව භාණ්ඩ අලෙවි කිරීම ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 48. | ශබ්ද විකාශන යන්ත්‍ර විදුලි ජනක යන්ත්‍ර කුලියට දීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 49. | ඛනිජ තෙල් වර්ග අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 50. | උත්සව සඳහා ශාලා කුලියට දීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 51. | ජෝතිෂ්‍ය සේවා මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 52. | කාය වර්ධන පුහුණු මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 53. | රේස් ඔට්ටු ඇල්ලීමේ (රේස් බුකියක්) ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 54. | පූජා භාණ්ඩ අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 55. | හඳුන්කූරු, සබන්, ඉටිපන්දම් නිපදවීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 56. | බිම්මල් නිෂ්පාදනය හා අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 57. | කුළුබඩු, මිරිස් කුඩු ඇතුළු බයිට් වර්ග නිෂ්පාදනය හා අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 58. | යෝගට් නිෂ්පාදනය හා අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 59. | වීදුරු අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 60. | පින්තූර රාමු කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 61. | ප්ලාස්ටික් භාණ්ඩ අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 62. | ඇළුමිනියම් භාණ්ඩ නිෂ්පාදනය හා අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 63. | පිත්තල භාණ්ඩ නිෂ්පාදනය හා අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගනෙ යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 64. | සම් භාණ්ඩ නිෂ්පාදනය කිරීම හා අලෙවි කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 65. | වේවැල් භාණ්ඩ නිෂ්පාදනය කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 66. | පී. වී. සී. බට, වතුර ටැංකි නිෂ්පාදනය කිරීම හා අලෙවි කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 67. | පාවහන් අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 68. | පාවහන් අලුත්වැඩියා කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 69. | ගඩොල් කැපීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 70. | කුෂන් වැඩපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 71. | කිරුම් මිණුම් උපකරණ අලෙවිසලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 72. | වීඩියෝ පට හා කැසට් පට අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 73. | ජංගම දුරකථන අලුත්වැඩියා කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 74. | ජංගම දුරකථන අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 75. | ඇස් කණ්ණාඩි අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 76. | අත් යන්ත්‍ර මගින් ඇඳුම් මැසීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 77. | අවමංගල්‍ය කටයුතු කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 78. | ලොතරැයි අලෙවි කුටියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 79. | නිවාස වයරින් කිරීමේ ද්‍රව්‍ය අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 80. | පුවත්පත්, සඟරා, ලිපිද්‍රව්‍ය අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 81. | දේශීය හා විදේශීය දුරකථන පහසුකම් සපයන ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 82. | ඡායාරූප ගැනීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 83. | රන්භාණ්ඩ අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 84. | ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 85. | සිමෙන්ති අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 86. | ඇස්බැස්ටස් සීට් අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 87. | ආලේපිත තීන්ත වර්ග අලෙවි ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 88. | සිමෙන්ති හා මැටි ආශ්‍රිත නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම හා අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |

| I වැනි තීරය කර්මාන්තයේ ස්වභාවය | | II වැනි තීරය පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම | | |
|---|---|---|---|---|
| | | රු. 750 ඉක්මවන විට | රු. 750ට වැඩි නමුත් රු. 1,500 නොඉක්මවන විට | රු. 1,500 ඉක්මවවිට |
| | | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| 89. | විසිතුරු මාළු, කුරුල්ලන් අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 90. | සිගරට් තොග වශයෙන් අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 91. | බීඩි හා සුරුට්ටු නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 92. | සහල් විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 93. | වී මිලදී ගැනීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 94. | ධාන්‍ය හෝ මාංශබෝග මිලදී ගැනීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 95. | ක්‍රීඩා භාණ්ඩ අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 96. | සංගීත භාණ්ඩ අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 97. | බුලත් පුවක් අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 98. | ඉංග්‍රීසි බෙහෙත් අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 99. | ඉංග්‍රීසි වෛද්‍ය ප්‍රතිකාර කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 100. | සිංහල වෛද්‍ය ප්‍රතිකාර කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 101. | සිංහල බෙහෙත් අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 102. | කම්මලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 103. | පලතුරු අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 104. | එළවළු අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 105. | සබන් නිෂ්පාදනය අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 106. | සංචාරක වෙළෙඳාම | 500 0 | 750 0 | 1,000 0 |
| 107. | වෙළඳ ප්‍රචාරක වැඩසටහනක් පවත්වාගෙන යාම (දිනකට) | 500 0 | 750 0 | 1,000 0 |
| 108. | රූපලාවන්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 109. | ගෘහ භාණ්ඩ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 110. | ගෘහ භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 111. | වඩුමඩුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 112. | කලුගල් කැඩීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 113. | යන්ත්‍රානුසාරයෙන් ගල්කැඩීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 114. | වී ඇඹරුම්හලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 115. | මිරිස් ඇඹරුම්හලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 116. | පොල්තෙල් සිඳීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 117. | ධාන්‍ය ඇඹරුම්හලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 118. | වී තම්බා සහල් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 119. | ඌරන්, එළුවන්, හරකුන් 20ට වැඩි ගාලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 120. | කුකුල් ගොවිපළක් පවත්වාගෙන යාම (10ට වැඩි) | 500 0 | 750 0 | 1,000 0 |
| 121. | පිඟන් භාණ්ඩ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 122. | ඉදල්, කොසු, නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 123. | වාහන පින්තාරු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 124. | මදුරු දැල් නිෂ්පාදනය කිරීම හා අලෙවි කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 125. | වෛද්‍ය රසායනාගාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 126. | මැණික් කැපීමේ, ඔප දැමීමේ, හා මිලදී ගැනීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 127. | කරවල අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 128. | පළතුරු බීම අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 129. | පැණි වර්ග නිෂ්පාදනය හා අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 130. | දන්ත ශල්‍යාගාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 131. | වාහන ස්ටිකර් සෑදීම හා අලෙවි කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 132. | පෞද්ගලික පන්ති පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 133. | පොල් ලී ගබඩාකර අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 134. | ලිහිසි තෙල් ගබඩා කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 135. | රස කැවිලි වර්ග නිෂ්පාදනය කිරීම හා අලෙවි කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 136. | වාහන ටින්කරින් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 137. | දුම්කොළ උදුනක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

**ඇළහැර ප්‍රාදේශීය සභාව - බකමූණ**

2014 වර්ෂයට ව්‍යාපාර බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තිය යටතේ ඇළහැර ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2013 වර්ෂයේ නොවැම්බර් මස 20 වැනි දින පවත්වන ලද ප්‍රාදේශීය සභා මාසික මහා සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

අමරවංශ මොහොට්ටිගේ,
සභාපති,
ඇළහැර ප්‍රාදේශීය සභාව,
බකමූණ.

2013 නොවැම්බර් මස 20 වැනි දින,
ඇළහැර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (I) වැනි උප වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ 150 වැනි වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ යම් ව්‍යාපාරයක් ඇළහැර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2014 වර්ෂයේ දී පවත්වාගෙන යන සෑම තැනැත්තෙකුගේ එම ව්‍යාපාරයේ 2013 වර්ෂයේ ආදායම මෙහි උපලේඛනයේ I වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුලත පවත්නා අවස්ථාවක එහි II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණය අනුව බද්දක් 2014 වර්ෂය සඳහා පනවා අයකල යුතු බවත් එකී බදු මුදල 2014 වර්ෂයේ මාර්තු මස 31 වන දිනට පෙර ගෙවා අවසන් කළ යුතු බව 2013.11.20 දින පැවැති මාසික මහා සභා රැස්වීමේදී ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කිත්සිරි බංඩාර මැතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජානක නලින් කුමාර මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසු සභා සම්මත විය.

***උපලේඛනය***

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* |
|---|---|
| 2013 වර්ෂයේ දී ව්‍යාපාර ආදායම | ගෙවියයුතු බද්ද<br>රු. ශත |
| රු. 6,000 නොඉක්මවන අවස්ථාවක | කිසිවක් නැත |
| රු. 6,000 ඉක්මවන එහෙත් රු. 12,000 නොඉක්මවන | 90 0 |
| රු. 12,000 ඉක්මවන එහෙත් රු. 18,750 නොඉක්මවන | 180 0 |
| රු. 18,750 ඉක්මවන එහෙත් රු. 75,000 නොඉක්මවන | 360 0 |
| රු. 75,000 ඉක්මවන එහෙත් රු. 1,50,000 නොඉක්මවන අවස්ථා | 1,200 0 |
| රු. 1,50,000 ඉක්මවන අවස්ථා | 3,000 0 |

02-472/1

---

**ඇළහැර ප්‍රාදේශීය සභාව - බකමූණ**

රථ වාහන හා සතුන් පිළිබඳ බද්ද - 2014

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වැනි වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර 2013 වර්ෂයේ නොවැම්බර් මස 20 දින පවත්වන ල ප්‍රාදේශීය සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වැනි වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර මෙහි පහත උපලේඛනයේ I වැනි තීරුවේ නිරූපිත සෑම වාහනයක් හෝ සතෙකු සම්බන්ධයෙන් එම උපලේඛනයේ II වැනි තීරුවේ නිරූපිත අනුරූප සටහනේ දැක්වෙන ප්‍රමාණයේ වූ වාහන හා සත්ව බද්දක් එනම් අය කළ යුතු බවට 2013 නොවැම්බර් මස 20 දින පැවැති ඇළහැර ප්‍රාදේශීය සභා රැස්වීමේදී ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජානක නලින් කුමාර මැතිතුමාගේ යෝජනත්වයෙන් හා ප්‍රාදේශීය සභා මන්ත්‍රී කිත්සිරි බංඩාර මැතිතුමා ස්ථිරත්වයෙන් සභා සම්මත විය.

*උපලේඛනය*

| | *I වැනි තීරුව* | *II වැනි තීරුව* *රු. ශ.* |
|---|---|---|
| 01. | මෝටර් රථයක්, මෝටර් ට්‍රයිසිකලයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක් බයිසිකලයක්, හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා | 25 0 |
| 02. | සෑම බයිසිකලයක්, ට්‍රයිසිකලයක් හෝ අත් කරත්තයක් සඳහා | |
| | *(අ)* වෙළඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම් | 18 0 |
| | *(ආ)* වෙළඳ නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම් | 4 0 |
| සෑම කරත්තයක් සඳහා | | 20 0 |
| සෑම අත්කරත්තයක් සඳහා | | 10 0 |
| සෑම රික්ෂෝවක් සඳහා | | 7 50 |
| සෑම අශ්වයෙකු හෝ පෝනියෙකු - කොටළුවෙකු සඳහා | | 50 0 |

02-472/4

---

**ඇළහැර ප්‍රාදේශීය සභාව - බකමූණ**

2014 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 147 වැනි වගන්තිය යටතේ ඇළහැර ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2013 නොවැම්බර් මස 20 වැනි දින පවත්වන ලද ප්‍රාදේශීය සභා මාසික රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

අමරවංශ මොහොට්ටිගේ,
සභාපති,
ඇළහැර ප්‍රාදේශීය සභාව,
බකමූණ.

2013 නොවැම්බර් මස 20 වැනි දින,
ඇළහැර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වන වගන්තිය සමග කියවිය යුතු 147 වැනි වගන්තිය යටතේ ඇළහැර ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි පහත උපලේඛනයෙහි පළවෙනි තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා ඇලහැර ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2014 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ දෙවන තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් පනවා අයකළ යුතු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චමින්ද කරුණානායක මැතිතුමා විසින් යෝජනා කළ අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජානක නලින් කුමාර මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසු සභා සම්මත විය."

*උපලේඛනය*

| | *I වැනි තීරුව* *බලපත්‍රයෙන් බලය දෙනු ලබන කාර්යය* | *II වැනි තීරුව* *පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම* | | |
|---|---|---|---|---|
| | | *රු. 750 නොඉක්මවන අවස්ථාවක* | *රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක* | *රු. 1,500 ඉක්මවන අවස්ථාවක* |
| | | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 01. | ලැගුම් නිවාසයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 02. | හෝටලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 03. | බත් කඩයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

| අනු. අංකය | I වැනි තීරුව බලපත්‍රයෙන් බලය දෙනු ලබන කාර්යය | II වැනි තීරුව පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම | | |
|---|---|---|---|---|
| | | රු. 750 නොඉක්මවන අවස්ථාවක | රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක | රු. 1,500 ඉක්මවන අවස්ථාවක |
| | | රු. ශත | රු. ශත | රු. ශත |
| 04. | ආපන ශාලාවක් පවත්වාගෙන යාම (රෙස්ටුරන්ට්) | 500 0 | 750 0 | 1,000 0 |
| 05. | තේ කඩයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 06. | කෝපි කඩයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 07. | බේකරියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 08. | කිරි පට්ටියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 09. | කිරි විකිණීම හා මිලදී ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | මාළු විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | මස් විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | අයිස් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | සිසිල් බීම කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | ලොන්ඩ්‍රියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | පෞද්ගලික වෙළෙඳපොළක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 16. | ගවගාලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 17. | කොණ්ඩා කැපීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 750 0 |
| 18. | කොණ්ඩ සැකසීමේ ස්ථානය පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 750 0 |
| 19. | ගෝ ඝාතක ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

යම් පරිශ්‍රයක්, හෝටලයක්, ආපන ශාලාවක් හෝ නවාතැන් පොළක කාර්යය සඳහා පාවිච්චි කරනු ලබන්නාවූ ද, 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්යයන් සඳහා එම හෝටලය, ආපන ශාලාව හෝ නවාතැන් පොළ ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තාවූ ද. අනුමත කර හෝ පිළිගත්තා වූ ද අවස්ථාවක බලපාන ගාස්තු 2013 වර්ෂයේ ඒ හෝටලයේ හෝ ආපන ශාලාවේ හෝ නවාතැන්පලෙහි ආදායමෙන් 01%ක් විය යුතු ය.

02-472/3

---

### ඇළහැර ප්‍රාදේශීය සභාව

2013 වර්ෂයේ අයකළ වරිපනම් බදු තක්සේරුව - 2014 වර්ෂයේ තක්සේරුව ලෙස පිළිගැනීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර 2013 වර්ෂයේ නොවැම්බර් මස 20 වැනි දින පවත්වන ලද ප්‍රාදේශීය සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

අමරවංශ මොහොට්ටිගේ,
ඇළහැර ප්‍රාදේශීය සභාව.

2013 නොවැම්බර් මස 20 වැනි දින,
බකමූණ,
ඇළහැර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### යෝජනාව

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි උපවගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ඇළහැර ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර ඇළහැර ප්‍රාදේශීය සභා වරිපනම් සීමාව ඇතුළත පිහිටි සියළුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල 2013 වර්ෂයේ දී බලාත්මක වූ වාර්ෂික වටිනාකම් තක්සේරුවම 2014 වර්ෂය සඳහා පිළිගැනීමටත් එම තක්සේරුව මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වැනි වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර එකී දේපළ මත වාර්ෂික වටිනාකමින් ඇළහැර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වරිපනම් සීමාව තුළ සෑම නිශ්චල දේපළකම වාර්ෂික තක්සේරු වටිනාකමින් බකමූණ නගරය තුළ 04% ප්‍රතිශතයකුත් දියබෙදුම නගරය දල 03% ප්‍රතිශතයකුත් ඇළහැර නගරය

දල 03% ප්‍රතිශතයකුත් 2014 වර්ෂයේ අයකළ යුතු බව ද ඇළහැර ප්‍රාදේශීය සභාව වෙත වරිපනම් ගෙවීමට යටත් සෑම තැනැත්තෙකු විසින්ම යථෝක්ත වරිපනම් 2014 වර්ෂයේ මාර්තු මස 31, ජුනි මස 30, සැප්තැම්බර් මස 30 සහ දෙසැම්බර් මස 31 යන දිනවලින් අවසන් වන කාර්තු 4 තුළ දී සමාන වාරික 4කින් ගෙවීමත්, 2013 නොවැම්බර් මස 20 දින පැවැති ඇළහැර ප්‍රාදේශීය සභා රැස්වීමේ දී ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජානක නලින් කුමාර මැතිතුමාගේ යෝජනත්වයෙන් හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කිත්සිරි බංඩාර මැතිතුමාගේ ස්ථිරත්වයෙන් සභා සම්මත විය.”

02-472/5

---

## ඇළහැර ප්‍රාදේශීය සභාව

### ප්‍රචාරක දැන්වීම්/දෘශ්‍ය පරිසරය පිළිබඳ ප්‍රචාරක දැන්වීම් සඳහා ගාස්තු අය කිරීම

ඇළහැර ප්‍රාදේශීය සභාව විසින් 2013 නොවැම්බර් මස 20 වැනි දින පවත්වන ලද ප්‍රාදේශීය සභා රැස්වීමේ දී ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කිත්සිරි බංඩාර මැතිතුමාගේ යෝජනාවෙන් හා ගරු ඇළහැර ප්‍රාදේශීය සභා මන්ත්‍රී කරුණානායක මැතිතුමාගේ ස්ථිරත්වයෙන් පහත සඳහන් යෝජනාව සභා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

අමරවංශ මොහොට්ටිගේ,
සභාපති,
ඇළහැර ප්‍රාදේශීය සභාව.

2013 නොවැම්බර් මස 20 වැනි දින,
බකමූණ,
ඇළහැර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

#### යෝජනාව

“1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(1) වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව ප්‍රචාරක දැන්වීම්/දෘශ්‍ය පරිසය පිළිබඳ විධිවිධාන ප්‍රකාශකර ඇළහැර ප්‍රාදේශීය සභා සීමාව තුළ යම් තැනැත්තෙකු විසින් යම් වීථියකට, පාරකට, ඇලකට, වැවකට, හෝ අහසට පෙනෙන පරිදි කිසිම දැන්වීමක් ප්‍රදර්ශන කිරීම හෝ ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම සඳහා පහත උපලේඛනයේ සඳහන් බලපත්‍ර ගාස්තුවක් අයකිරීමට ඇළහැර ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.”

#### *උපලේඛනය*

| | | රු. ශත |
|---|---|---|
| 01. | බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කරනු ලබන ඕනෑම ප්‍රචාරක දැන්වීමක් සඳහා සෑම වර්ග අඩියකටම (වසරකට) | 80 0 |
| 02. | බැනරයක් මගින් ප්‍රදර්ශනය කරනු ලබන ඕනෑම ප්‍රචාරක දැන්වීමක් සඳහා සෑම වර්ග අඩියකටම (මසකට) | 30 0 |
| 03. | බැනරයක් මගින් ප්‍රදර්ශනය කරනු ලබන ඕනෑම ප්‍රචාරක දැන්වීමක් සඳහා සෑම වර්ග අඩියකටම (මසකට වැඩි) | 50 0 |
| 04. | කිසියම් වීදියකට හෝ පාරකට මුහුණලා යාව පිහිටි ගොඩනැගිල්ලක මුහුණතෙහි හෝ වෙළෙඳශාලා නාම පුවරු හෝ ඒ ගොඩනැගිල්ල මුහුණතෙහි පාරට මුහුණලා සිටින විට ප්‍රචාරක දැන්වීමක් සවි කිරීම හෝ එල්ලා තැබීම වර්ග අඩියකට (වසරකට) | 60 0 |

02-472/6

---

## ඇළහැර ප්‍රාදේශීය සභාව

### අංක 47 දරන පාරිසරික පනත යටතේ පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ගාස්තු අය කිරීම - 2014 වර්ෂය

2000 අංක 53 හා 1988 අංක 59 දරන පනත් මගින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 26 වැනි වගන්තිය යටතේ ස්ථාපිත මධ්‍යම පරිසර අධිකාරිය වර්ෂ 2001 සැප්තැම්බර් මස 01 වැනි දින සිට පළමුවැනි උපලේඛනයේ නිශ්චිතව සඳහන් බලපත්‍ර කාර්යයන් හා කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීම සඳහා ඇළහැර ප්‍රාදේශීය සභාවේ සභාපති වන මා වෙත මෙයින් බලය පැවරේ. එකී බලතල අනුව ඇළහැර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ආරම්භකර පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයේ ඉහත කී පනතේ අදාල සංශෝධන යටතේ පැවරී ඇති රෙගුලාසිවලට අනුකූලව එකී ව්‍යාපාර කර්මාන්ත පවත්වාගෙන යනු ලබන්නන් විසින් 2000 සැප්තැම්බර් මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉහත ගැසට් නිවේදනයේ (ඇ) කොටසට අයත් වන නියමිත කටයුතු වශයෙන් හඳුන්වා ඇති කර්මාන්ත ක්‍රියාවලිය සඳහා ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු වේ.

#### බලපත්‍ර ගාස්තු

2000 අංක 53 දරන ජාතික පාරිසරික (සංශෝධන) පනතට අනුව නිකුත් කළ අංක 1159/22 හා 2000 නොවැම්බර් මස 22 දිනැති ගැසට් පත්‍රයේ 7A පිටුවේ දක්වා ඇත.

ඒ අනුව ගැසට් පත්‍රයේ උපලේඛනයේ (අ) කොටසට අයත්වන ක්‍රියාකාරකම් සඳහා (දැනට පළාත් පාලන ආයතනවලට පවරා ඇති) පරිසර ආරක්ෂණ බලපත්‍ර ගාස්තු රු. 4,000කි.

පාරිසරික බලපත්‍ර පරීක්ෂා කිරීමේ ගාස්තු

| | ආයෝජනය රුපියල් | පරීක්ෂා කිරීමේ ගාස්තු (උපරිම) රු. ශත |
|---|---|---|
| 01. | රු. 2,50,000 හෝ ඊට අඩු | 3,000 |
| 02. | රු. 2,50,001 සිට රු. 5,00,000 දක්වා | 3,750 |
| 03. | රු. 5,00,001 සිට රු. 10,00,000 දක්වා | 5,000 |
| 04. | රු. 10,00,000 ට වැඩි | 10,000 |

ඉහත සඳහන් බදු ප්‍රමාණයන් හා ගාස්තු 2014.01.01 දින සිට ඉදිරියට ක්‍රියාත්මක වන බව සැලකිය යුතුයි.

*උපලේඛනය*

1. සියලුම වාහන ඉන්ධන පිරවුම්හල් (ද්‍රව පෙට්‍රෝලියම් හා ද්‍රවීකෘත පෙට්‍රෝලියම් වායු)
2. සේවක සංඛ්‍යාව 10ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සහ 25ට අඩු සේවක සංඛ්‍යාවක් සේවයේ යොදවන පොල්තෙල් සිඳීමේ කර්මාන්ත
3. සේවක සංඛයාව 10ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සහ 25ට අඩු සේවක සංඛ්‍යාවක් සේවයේ යොදවන මධ්‍යසාර අඩංගු නොවන බීම වර්ග නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත.
4. වියළි ක්‍රියාවලි සහිත වී මෝල්
5. මාසික නිෂ්පාදන ධාරිතාව කිලෝ ග්‍රෑම් 1,000 කට අඩුවන ඇඹරුම්හල්
6. දුම්කොළ වේලීමේ කර්මාන්ත
7. කෑමට ගන්නා ලුණු ඇඹරීමේ හා සැකසීමේ කර්මාන්ත
8. කොන්ක්‍රීට් පෙරසවි කර්මාන්ත
9. යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක් ගල් නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත
10. උළු සහ ගඩොල් කර්මාන්ත
11. එක් වරකට එක් බෝර වලක් බැගින් පුපුරවමින් මසකට ඝන මීටර් 600 ක නිෂ්පාදන ධාරිතාවයකට අඩු මිනිස් ශ්‍රමය හා පුපුරණ ද්‍රව්‍ය භාවිතයෙන් සිදු කරනු ලබන කැණීම්
12. දිනකට ඝන මීටර් 50 ට අඩු දැව ඉරුම් ධාරිතාවයක් ඇති ලී මෝල් හෝ බෝරෝන් පිරියම් ක්‍රමය භාවිතයෙන් දැව පිරියම් කිරීමේ කර්මාන්ත හෝ දැව පදම් කිරීමේ කර්මාන්ත
13. බහුකාර්ය යන්ත්‍ර භාවිතා කරන වඩු කර්මාන්ත හෝ සේවකයින් 5 ට වැඩි 25 ට අඩු ගණනක් සේවයේ යොදවන දැව ආශ්‍රිත කර්මාන්ත
14. නේවාසික කාමර 05 හෝ ඊට වැඩි සහ 20 ට අඩු හෝටල්, ආගන්තුක නිවාස සහ තානායම්
15. වාහනවල වායු සමීකරණ යන්ත්‍ර අළුත්වැඩියා කිරීමේ, නඩත්තු කිරීමේ හා සවිකිරීමේ කටයුතු හෝ විසිරි පින්තාරු කටයුතු සිදුකරන ගරාජ හැර අනිකුත් වාහන අලුත්වැඩියා කිරීමේ/නඩත්තු කිරීමේ කටයුතු සිදුකරන ගරාජ
16. ශීතකරණ හා වායු සමන යන්ත්‍ර අළුත්වැඩියා කිරීම, නඩත්තු කිරීම හා සවිකිරීම සිදුකරන ස්ථාන
17. සේවකයින් 10ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සේවයේ යෙදෙන සියලුම විදුලි හෝ ඉලෙක්ට්‍රොනික් භාණ්ඩ අලුත්වැඩියා කිරීමේ ස්ථාන
18. ඊයම් උණු කිරීම සිදු කිරීම ඇතුළත් නොවන මුද්‍රණාල සහ අතුරු මුද්‍රණය කිරීමේ යන්ත්‍ර
19. සේවක සංඛ්‍යාව 10ක් හේ ඊට වැඩි සංඛ්‍යාවක් සේවයේ යෙදෙන ඉටි පන්දම් නිෂ්පාදන කර්මාන්ත
20. සල්ෆර් දුම්ගැසීම සහිත එක් ක්‍රියාවලියකදී නිෂ්පාදන ධාරිතාව කිලෝ ග්‍රෑම් 500 ක් හෝ එයට වැඩි ධාරිතාවයක් සහිත කුරුඳු දුම් ගැසීමේ කර්මාන්ත
21. ක්ෂනික තේ කර්මාන්ත ශාලා හැර අනෙකුත් තේ කර්මාන්ත ශාලා
22. දිනකට මෙට්‍රික් ටොන් 20ට අඩු නිෂ්පාදන ධාරිතාවයක් සහිත හුණු පෝරණු
23. ප්ලාස්ටර් ඔෆ් පැරිස් නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත හෝ සේවකයන් 25ට අඩු සේවක සංඛ්‍යාවක් සේවයේ නියුක්ත පිඟන් මැටි භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත
24. සියලු බෙලිකටු ඇසිරීමේ කර්මාන්ත
25. වාහන සේවා කටයුතු සිදු නොකරන කන්ටේනර් බහාලුම් පර්යන්ත

02-472/7

---

**ඇළහැර ප්‍රාදේශීය සභාව - බකමූණ**

ක්‍රීඩා පිටිය සහ රැස්වීම් ශාලාව කුලියට දීමේ ගාස්තු - 2014

ඇළහැර ප්‍රාදේශීය සභාව සතු මහවැලි ක්‍රීඩාංගණය හා රංග ශාලාව කුලියට ලබාදීමේ ගාස්තු වශයෙන් පහත සඳහන් ආකාරය අය කිරීමට සුදුසු බවට 2013 නොවැම්බර් මස 20 වැනි දින පැවැති ප්‍රාදේශීය සභා මාසික රැස්වීමේදී ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කිත්සිරි බංඩාර මැතිතුමා විසින් ගෙන එන යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජානක නලින් කුමාර මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසු සම්මත වී ඇති බව මෙයින් නිවේදනය කරමි.

*රංග ශාලාව :*

| | | | | රු. ශත |
|---|---|---|---|---|
| 01. | පෙ.ව. 6.00 සිට ප. ව. 6.00 දක්වා | 01. | වාණිජ කටයුතු සඳහා (ශබ්දවාහිනී සමග) | 15,000 0 |
| 02. | ප.ව. 6. 00 සිට රාත්‍රී 12.00 දක්වා | 02. | වාණිජ කටයුතු සඳහා (ශබ්දවාහිනී නොමැතිව) | 10,000 0 |
| 03. | පෙ. ව. 6.00 සිට මධ්‍යාහ්න 12.00 දක්වා | 03. | වාණිජ නොවන කටයුතු සඳහා (ශබ්දවාහිනී සමග) | 8,000 0 |
| 04. | මධ්‍යාහ්න 12.00 සිට ප.ව. 6.00 දක්වා | 04. | වාණිජ නොවන කටයුතු සඳහා (ශබ්දවාහිනී නොමැතිව) | 3,000 0 |

*ක්‍රීඩාපිටිය ලබාදීම :*

01. ක්‍රීඩා පිටිය දිනකට ලබාදීම රු. 5,000 0

අමරවංශ මොහොට්ටිගේ,
සභාපති,
ඇළහැර ප්‍රාදේශීය සභාව,
බකමූණ.

2013 නොවැම්බර් මස 20 වැනි දින,
ඇළහැර ප්‍රාදේශීය සභාවේ දී ය.

02-472/8

---

**මහනුවර මහ නගර සභාව**

ආදාහන පිළිබඳ ගාස්තු අයකිරීම - 2014

1979 අංක 42 දරන මහ නගර සභා (සංශෝධන) පනතේ සහ 1946 අංක 57 දරන පොදු සුසානභූමි හා පුද්ගලික සුසාන භූමි පිළිබඳ ආඥාපනතේ 22(1) වගන්තිය ප්‍රකාරව ආදාහන පිළිබඳ ගාස්තු අයකිරීමට 2013.10.28 අංක 8(28) දරන සභා තීරණය සහ 2011.05.31 අංක 8(26) දරන සභා තීරණය සහ 1999.02.23 අංක 9(60) දරන සභා සම්මුති මගින් අනුමත කර ඇත.

ඒ අනුව පහත උපලේඛනයේ සඳහන් ගාස්තු 2014 වර්ෂය සඳහා ක්‍රියාත්මක වන බව මෙයින් නිවේදනය කරමි.

තුෂාන්ත මහීන්ද්‍ර රත්වත්තේ,
පුරපති,
මහනුවර මහ නගර සභාව.

2014 ජනවාරි මස 29 වැනි දින,
මහනුවර මහ නගර සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| | | රු. ශත |
|---|---|---|
| 01. | *නගර සීමාව තුළ පදිංචි* | |
| | සාමාන්‍ය වේලාව තුළ | 4,750 0 |
| | සාමාන්‍ය වේලාවෙන් පසු | 5,750 0 |
| 02. | *නගර සීමාවෙන් පිටත පදිංචි* | |
| | සාමාන්‍ය වේලාව තුළ | 7,000 0 |
| | සාමාන්‍ය වේලාවෙන් පසු | 8,000 0 |
| 03. | ප. ව. 6.00 න් පසුව සිදු කරන ආදාහන සඳහා අමතර අය කිරීම | 300 0 |
| 04. | දර සෑයක් යොදා ගනිමින් ආදාහනය කිරීම සඳහා බිම් කුලිය | 7,000 0 |

02-542/1

---

**මහනුවර මහ නගර සභාව**

භූමදාන ගාස්තු අයකිරීම - 2014

1979 අංක 42 දරන මහ නගර සභා (සංශෝධන) පනතේ සහ 1946 අංක 5 දරන පොදු සුසානභූමි හා පුද්ගලික සුසාන භූමි පිළිබඳ ආඥාපනතේ 22(1) වගන්තිය ප්‍රකාරව භූමදාන පිළිබඳ ගාස්තු අයකිරීමට 2011.09.22 අංක 64 දරන තීරණය මගින් අනුමත කර ඇත.

ඒ අනුව පහත උපලේඛනයේ සඳහන් ගාස්තු 2014 වර්ෂය සඳහා ක්‍රියාත්මක වන බව මෙයින් නිවේදනය කරමි.

තුෂාන්ත මහීන්ද්‍ර රත්වත්තේ,
පුරපති,
මහනුවර මහනගර සභාව.

2014 ජනවාරි මස 29 වැනි දින,
මහනුවර මහනගර සභා කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

| | | *රු. ශත* |
|---|---|---|
| 01. | වැඩිහිටි මෘත දේහයක් සඳහා | 1,000 0 |
| 02. | ළදරු මෘත දේහයක් සඳහා | 750 0 |
| 03. | හිමිකම් නොපෑ මෘත ශරීරයක් භූමදානය : | |
| | වැඩිහිටි මෘත දේහයක් සඳහා | 100 0 |
| | ළදරු මෘත දේහයක් සඳහා | 50 0 |

02-542/2

---

## මහනුවර මහනගර සභාව

### භෂ්මාවශේෂ තැන්පත් කිරීම සහ සිහිවටන ඵලක ඉදිකිරීම සම්බන්ධ ගාස්තු අයකිරීම - 2014

1979 අංක 42 දරන මහ නගර සභා (සංශෝධන) පනතේ සහ 1946 අංක 57 දරන පොදු සුසාන භූමි හා පුද්ගලික සුසාන භූමි පිළිබඳ ආඥා පනතේ 22(1) වගන්තිය ප්‍රකාරව භෂ්මාවශේෂ තැන්පත් කිරීම සහ සිහිවටන ඵලක ඉදිකිරීම සඳහා ගාස්තු අයකිරීමට 2008.10.03 අංක 8(32) දරන සභා තීරණය සහ 2013.05.27 අංක 8(19) දරන සභා තීරණය සහ 2013.07.25 අංක 8(16) දරන සභා තීරණ මගින් අනුමත කර ඇත.

ඒ අනුව පහත උපලේඛනයේ සඳහන් ගාස්තු 2014 වර්ෂය සඳහා ක්‍රියාත්මක වන බව මෙයින් නිවේදනය කරමි.

තුෂාන්ත මහීන්ද්‍ර රත්වත්තේ,
පුරපති,
මහනුවර මහනගර සභාව.

2014 ජනවාරි මස 29 වැනි දින,
මහනුවර මහනගර සභා කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

| | | *රු. ශත* |
|---|---|---|
| 01. | මහයියාව පොදු සුසානභූමියේ සිහිවටන ඵලයක් ඉදිකිරීම (විශ්කම්භය අඩියක ප්‍රමාණය) | 50,000 0 |
| 02. | අතුරු සුසානභූමිවල සිහිවටන ඵලකයක් ඉදිකිරීම (විෂ්කම්භය අඩියක ප්‍රමාණය) | 30,000 0 |
| 03. | එම බිම් කොටස්වල පවුලේ අයෙකුගේ භෂ්මාවශේෂ තැන්පත් කිරීම | 6,000 0 |
| 04. | මල් පෝච්චියක භෂ්මාවශෙෂ තැන්පත් කිරීම | 5,000 0 |

02-542/3

---

## මහනුවර මහනගර සභාව

### රූගත කිරීම සම්බන්ධ ගාස්තු අයකිරීම - 2014

1979 අංක 42 දරන මහනගර සභා (සංශෝධන) පනතේ සහ 1946 අංක 57 දරන පොදු සුසානභූමි හා පුද්ගලික සුසාන භූමි පිළිබඳ ආඥාපනතේ 22(1) වගන්තිය ප්‍රකාරව සුසාන භූමි රූගත කිරීම සඳහා ගාස්තු අයකිරීමට 2008.04.28 අංක 8(20) දරන සභා තීරණය මගින් අනුමත කර ඇත.

ඒ අනුව පහත උපලේඛනයේ සඳහන් ගාස්තු 2014 වර්ෂය සඳහා ක්‍රියාත්මක වන බව මෙයින් නිවේදනය කරමි.

තුෂාන්ත මහීන්ද්‍ර රත්වත්තේ,
පුරපති,
මහනුවර මහනගර සභාව.

2014 ජනවාරි මස 29 වැනි දින,
මහනුවර මහනගර සභා කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

| | | *රු. ශත* |
|---|---|---|
| 01. | මහයියාව සුසාන භූමියේ රූගත කිරීම් සඳහා ගාස්තු : | |
| | චිත්‍රපට සඳහා | 10,000 0 |
| | ටෙලිනාට්‍ය සඳහා | 7,500 0 |
| | ගීත | 3,000 0 |
| | වෙනත් | 7,500 0 |
| 02. | වෙනත් නාගරික සුසානභූමියක් රූගත කිරීම සඳහා ගාස්තු : | |
| | චිත්‍රපට සඳහා | 7,500 0 |
| | ටෙලිනාට්‍ය සඳහා | 7,500 0 |
| | ගීත | 2,000 0 |
| | වෙනත් | 7,500 0 |

02-542/4

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.